


විනුති දහම්සා බණ්ඩාර



# මලී බබයි
# බෝනික්කයි

විනුති දහම්සා බණ්ඩාර

මලී බබයි බෝනික්කයි

©විනුති දහම්සා බණ්ඩාර
මහාමායා බාලිකා විදුහල
3 ශ්‍රේණිය D
2023-12-11

ISBN 978-624-206-999-9

පිදුම

මා හට අකුරු කියාදී

ආදරයෙන් රැක බලා ගත්

මාගේ ආදරණීය

ගුරු මෑණිවරුන්ට

හා

ගුරු පියවරුන්ට

මෙම පොත පුදමි..

## ස්තූතිය

මා හට අකුරු ඉගැන්වූ ගුරුවරුන්ටද, හැමදාමත් ආදරයෙන් මා හට උදව් කරන මගේ අප්පච්චිටද, අම්මාටද ස්තූතියි.

විනුති දහම්සා බණ්ඩාර,
3 ශ්‍රේණිය D,
මහාමායා බාලිකා විදුහල,
මහනුවර.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකූර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023-10-20

ඔන්න එකෝමත් එක ගමක පුංචි පවුලක් හිටියා. ඒ පවුලේ හිටියා අහිංසක ළමයෙක්. එයාගේ නම මලී. මලීගේ පවුල දුප්පත්. ඒ නිසා මලීට තිබුණේ එකම සෙල්ලම් බඩුවයි. ඒ තමා බෝනික්කෙක්.



එයා හැමදාම ඒ බෝනික්කා

එක්ක සෙල්ලම් කරා. එක දවසක්

එයා එහෙම සෙල්ලම් කරනකොට

එතනට වඳුරෙක් ආවා.

එතකොටම අම්මා මලීට කතා

කළා. එතකොට මලී බෝනික්කව

එතනම තියලා කුස්සියට දිව්වා.



මලීට අම්මා කිව්වා ඉස්කෝලේ

වැඩ කරන්න කියලා. මලී අම්මට

හා කියලා ආයෙත් දුවගෙන ආවා

බෝනික්කව ගන්න හිතලා. ඒත්

මලී පරක්කු වැඩියි. මොකද?

වඳුරා මලී එනවත් එක්කම

බොනික්කව අරගෙන ගියා. මලී

හොඳටම ඇඬුවා.



මලී අඬන සද්දෙට අම්මයි, තාත්තයි දුවගෙන ආවා. අම්මා සහ තාත්තා ඇහුවා "ඇයි දුව අඬන්නේ කියලා?" එතකොට මලී කිවුවා "මගේ බෝනික්කව වඳුරෙක් අරන් ගියා" කියලා. එහෙම අඬ අඬා ඉන්නකොට එයාගේ හොඳම යාළුවා ආවා. ඒ තමයි රෝසි. රෝසිත් ඇහුවා "ඇයි මලී අඬන්නේ" කියලා. එතකොට මලී කිව්වේ අර කලින් දුන්න උත්තරේමයි. ඊට පස්සේ මලි අඬන දිහා බලන් ඉන්න බැරි

නිසා රෝසි ඉක්මනින් ගෙදර
දුවලා ගිහිල්ලා එයා ළඟ වැඩිපුර
තිබුණා බෝනික්කෙක් මලීට
ගෙනත් දුන්නා. එදැයින් පස්සේ
මලී එයාගේ අලුත් බෝනික්කා
එක්ක සතුටින් හිටියා.





# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරිම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023-10-20

ISBN 978-624-206-999-9